# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2344/19 - 2023 අගෝස්තු මස 09 වැනි බදාදා - 2023.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) වගන්තිය යටතේ සාදන රීති

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ ව්‍යවස්ථාව සමග කියවිය යුතු 154 ඇ ව්‍යවස්ථාව යටතේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 (5) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සාදන ලද, "බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ සංශෝධිත රීති" මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී පීඑච්ඩී (ගෞරව),
එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2023 ක් වූ ජූලි මස 31 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6436 — 13 (2023/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රීති**

01. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති සංශෝධනය කිරීම සඳහා පනවනු ලබයි.

02. මෙම රීති බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ (සංශෝධිත) රීති යනුවෙන් හැඳින්වේ.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2186/26 හා 2020 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ රීති 12 වගන්තිය 12 (1) උපවගන්තිය ලෙස අංකනය කරමින් ඉන් ඉක්බිතිව පහත උපවගන්ති ඇතුළත් කරමින් මෙයින් සංශෝධනය කරනු ලබයි.

(ii) මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන තීරණයකට අදාළ අභියාචනයක්, අභියාචක විසින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කිරීමේ දී බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් වෙත හෝ එම ප්‍රසම්පාදනයට අදාළ ආස්ථිත්වය වෙත ප්‍රසම්පාදනයෙහි මූල්‍ය වටිනාකම් අනුව පහත සඳහන් වටිනාකම් යටතේ මුදල් තැන්පත් කර ඊට අදාළ ලදුපතෙහි ඡායා පිටපතක් සමඟ අදාළ අභියාචනය ඉදිරිපත් කළ යුතුය.

| *ප්‍රසම්පාදනයේ වටිනාකම* | *තැන්පත් මුදල* |
|---|---|
| රු. මිලියන 250 ට වැඩි | රු. 100,000.00 |
| රු. මිලියන 200 - 250 | රු. 75,000.00 |
| රු. මිලියන 100 - 200 | රු. 50,000.00 |
| රු. මිලියන 25 - 100 | රු. 25,000.00 |
| රු. මිලියන 25 ට අඩු | රු. 15,000.00 |

(iii) නිසි පරිදි තැන්පත් මුදල් තැන්පත් කර ඊට අදාළ ලදුපත්හි පිටපතක් සමඟ අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ නම් මිස අදාළ අභියාචනය මෙම වගන්තිය යටතේ නිසියාකාරව ඉදිරිපත් කර ඇති අභියාචනයක් වශයෙන් සලකා ක්‍රියා නොකළ යුතුය.

(iv) මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කරන අභියාචනයක් මගින් අභියාචනයට අදාළ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තිරණය වෙනස් වන අවස්ථාවකදී අභියාචක වෙත අදාළ තැන්පත් මුදල් නිදහස් කිරීමට ක්‍රියා කළ යුතු අතර අභියාචකගේ අභියාචනය ප්‍රතික්ෂේප වීමක දී අදාළ තැන්පත් මුදල් පළාත් සභා අරමුදලට බැර කළ යුතුය.

04. මෙම රීති යටතේ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් එවිට සිංහල පාඨය ප්‍රමුඛ වෙයි.

EOG 08 - 0091

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.